## නව විදුලි සේවා සැපයුමක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍රය සම්පූර්ණකිරීම සඳහා අවශ්‍ය උපදෙස්

**අයදුම්පතේ අනු අංක පිළිවෙලින් පහත දක්වා ඇති උපදෙස් අනුව අයදුම්පත සම්පූර්ණ කළ යුතුයි.**

1. පූජ්‍ය/මයා/මෙනෙවිය/මිය අතරින් අනවශ්‍ය වචන කපා හැරිය යුතුය.මුලකුරු වලින් හැඳින්වෙන නම් සමඟ ජාතික හැඳුනුම්පතේ දැක්වෙන පරිදි සම්පූර්ණ නම ලිවිය යුතුය.

   උදා. දිසානායක මුදියන්සේලාගේ නාමල් දිසානායක

2. අයදුම්කරුගේ මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවිය යුතු අතර, එක් අකුරක් සඳහා එක් කොටුවක් බැගින් භාවිතා කළ යුතුය.

   උදා :

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| D | . | M | . | N | . | D | I | S | S | A | N | A | Y | A | K | A |

3. නව විදුලි සේවා සැපයුම ලබා ගැනීමට යෝජිත පරිශ්‍රයෙහි ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් සඳහන් කළ යුතු අතර, එක් අකුරක් සඳහා එක් කොටුවක් බැගින් භාවිතා කළ යුතුය.

4. නව විදුලි ගිණුම ආරම්භවන තෙක් වෙනත් ස්ථානයකට ලිපි ලැබිය යුතු නම් පමණක් එහි ලිපිනය සඳහන් කළ යුතුය.

   4.1. මෙම ලිපිනය ස්ථිරවම ලිපි ගනුදෙනු සඳහා යොදාගන්නේ නම් අදාල කොටුව තුල (✓) ලකුණ යොදන්න

5. අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කල යුතු අතර, එක් කොටුවකට එක් අංකයක් වන පරිදි සඳහන් කල යුතුය.

   **<u>ජාතික හැඳුනුම්පත නොමැති නම් පමණක්</u>** විදුලි අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා ගමන් බලපත්‍ර/රියදුරු බලපත්‍ර අංකය සහ වර්ගය මෙහි සඳහන් කළ යුතුය.

6. අයදුම්කරුගේ ස්ථාවර සහ ජංගම දුරකථන අංක සඳහන් කළ යුතුය. විදුලි සේවාව සඳහා ඔබගේ ලියාපදිංචිය, ඔබගේ ඇස්තමේන්තු මුදල සහ ඉදිරියේදී ඔබගේ ප්‍රදේශයේ විදුලිය අත්හිටුවීම්, දීර්ඝ විදුලි බිඳ වැටීම් ,ඔබගේ බිල්පත් සම්බන්ධ තොරතුරු හෝ ගෙවීම් වැනි තොරතුරු කෙටි පණිවිඩ සේවාව (SMS) මඟින් ඔබ වෙත දැනුම්දීමට මෙම ජංගම දුරකථන අංකය භාවිතා කිරීමට නියමිත බැවින් එම සේවාවන් ලබාගැනීම සඳහා ඔබගේ නිවැරදි ජංගම දුරකථන අංකය මෙහි සඳහන් කිරීමට කටයුතු කරන්න.

7. විදුලි සැපයුම අවශ්‍ය පරිශ්‍රයට මීට පෙර විදුලි සේවා සැපයුමක් ලබා ගෙන තිබුණේ නම් එහි විදුලි ගිණුම් අංකය සඳහන් කළ යුතුය.

8. ඔබගේ අවශ්‍යතාව අනුව අදාල කොටුව තුල (✓) ලකුණ යොදන්න. මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලිකිරීම් අවශ්‍ය නම් ළඟම තිබෙන ලං .වි .ම පාරිභෝගික සේවා මධ්‍යස්ථානයෙන් විමසිය හැක.

   8.1. විදුලි සේවා සැපයුමක් ලබාගත් පසු ස්ථිරවම එය පවත්වාගෙන යාමට අවශ්‍ය අයදුම්කරුවන්.

8.2. පවත්නා සේවාවක් වැඩි දියුණු කිරීමක් සඳහා. මෙහිදී දැනට පවතින සේවාව සටහන් කරන්න.

උදා :- එකලා ඇම්පියර් 30 දැනට පවතී නම් එය 1P 30A සටහන් කරන්න
තෙකලා ඇම්පියර් 30 දැනට පවතී නම් එය 3P 30A සටහන් කරන්න

8.3. තාවකාලික විදුලි සැපයුමක් අවශ්‍ය අයදුම් කරුවන්.
මෙම සැපයුම උපරිම දින 14 කට යටත්ව ලබාදෙනු ලැබේ.
උදා :- සැණකෙළි, කෙටි උත්සව , අවමංගල උත්සව ආදී

8.4. යම්කිසි කාලයකට පසු ස්ථිර කල හැකි සැපයුමක්.
මෙහිදී ආරම්භයේදී තාවකාලිකව යම්කිසි ස්ථානයකට සැපයුමක් ලබාගෙන පසුකලෙක එය ස්ථිරව පවත්වාගෙන යා හැකි වන පරිදි පරිවර්තනය කල හැකි සැපයුමක් .
උදා :- තනාගෙන යන නිවසක් හෝ ගොඩනැගිල්ලක්, මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාගන්නා සැපයුම් ආදී

8.5. අනු අංක 8.3 හෝ 8.4 යටතේ ඇති තාවකාලික සේවාවක් නම් අවශ්‍ය දින ගණන දල වශයෙන් සටහන් කරන්න.

9. නව විදුලි සේවා සැපයුම අයදුම් කරනු ලබන අවශ්‍යතාවයට අදාල පහත දක්වා ඇති පරිදි ඉංග්‍රීසි අක්ෂරය සඳහන් කළ යුතුය. ඔබගේ අවශ්‍යතාවය පහත දක්වා ඇති ලැයිස්තුවේ නොමැති නම් **ඉල්ලුම්පත්‍රයේ අදාල හිස්තැනෙහි** ඔබගේ විදුලි අවශ්‍යතාවය සඳහන් කළ යුතුය.

| | |
|---|---|
| A | නිවස |
| B | තනාගෙන යනු ලබන ගොඩනැගිල්ල |
| C | හෝටලය |
| D | වෙළඳ ව්‍යාපාරය |
| E | ආගමික ස්ථානය |
| F | කාර්යාලය |

| | |
|---|---|
| G | පැස්සුම් වැඩපොළ /ලී මෝල්/ගල් මෝල් |
| H | රජයේ රෝහල් / රජයේ පාසැල් |
| I | රජයේ විශ්ව විද්‍යාල/වෘත්තීය පුහුණුආයතන |
| J | කර්මාන්තශාලා |
| K | ප්‍රජා ජල පොම්පාගාර |
| L | වගා කටයුතු සඳහා ජල පොම්ප කිරීම |

10. අයදුම් කරනු ලබන විදුලි සේවා සැපයුම් වර්ගයට ඉදිරියෙන් (✓) ලකුණ යෙදිය යුතුය. (15A සේවා සැපයුම් ඔබට ලබාගත හැක්කේ කොළඹ සහ මහනුවර නගර වල පමණි.)

11. දවසේ වේලාව අනුව ගාස්තු අයකරන අයක්‍රමය ඔබ ලබාගැනීමට අදහස් කරන්නේ නම් ඒ බව සඳහන් කළ යුතුය.මෙම අයක්‍රමයේදී දිනය වෙලාව අනුව කොටස් තුනකට ( දිවා කාලය, කාර්යබහුල හා කාර්යබහුල නොවන) බෙදා ඇති අතර අදාල කාලපරිච්ඡේදය තුල පරිභෝජනය කරන විදුලි ඒකක ප්‍රමාණයට එම කාලපරිච්ඡේදය සඳහා අනුමත ගාස්තුවට අනුව අයකිරීම් සිදු කරනු ලැබේ.

12. GPS ඛණ්ඩාංක දන්නේ නම් අක්ෂාංශය හා දේශාංශය අදාල කොටු තුල සටහන් කරන්න.

උදාහරණය : කොළඹ 02 හි පිහිටි ලංවිම ප්‍රධාන කාර්යාලයේ GPS ඛණ්ඩාංකය

| අක්ෂාංශය | | | | | | | | | දේශාංශය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6 | . | 9 | 3 | 0 | 3 | 2 | 3 | | 7 | 9 | . | 8 | 4 | 4 | 8 | 9 | 3 |

13. GPS ඛණ්ඩාංක නොදන්නේ නම් විදුලි සේවා සැපයුම අයදුම් කරන ස්ථානයට පහසුවෙන් ළඟා විය හැකි පරිදි දළ සැලැස්මක් දැක්විය යුතුය.

14. අයදුම්කරුගේ නමින් වෙනත් පරිශ්‍ර සඳහාවිදුලි සැපයුම් ලබා ගෙන තිබේ නම් එම විදුලි ගිණුම් අංක සඳහන් කළ යුතුය.

15. අයදුම්කරු විසින් අයදුම් පත්‍රයේ සපයා ඇති සියලු තොරතුරු සත්‍ය බවට සහතික කොට, යම් හෙයකින් වෙනත් අයෙකුගේ ඉඩම්/නිවාස/දේපල හරහා අදින ලද රැහැන් මාර්ගයක් වෙනස් කිරීමට සිදුවුවහොත් ඒ සඳහා වැයවන සම්පූර්ණ මුදල ගෙවීමටද පොරොන්දු වෙමින් සහ ගිවිසුම්ගත ධාරිතාවය ඉක්මවා නොයන පරිදි විදුලිය පරිභෝජනය කිරීමට පොරොන්දු වෙමින් සුපුරුදු සම්පූර්ණ අත්සන සහ දිනය යෙදිය යුතුය.